නිපුණතාව 2 - ඉල්ලුම,සැපයුම,නම්‍යතාව හා වෙළෙඳපොල සමතුලිතය සමතුලිතය විශ්ලේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.1 - ඉල්ලුම් තීරක ඇසුරින් ඉල්ලුම් න්‍යාය හා ඉල්ලුම් නීතිය විග්‍රහ කරයි.

ඉල්ලුම් නීතිය ඉදිරිපත් කළ හැකි විකල්ප ක්‍රම පහත පරිදි දැක්විය හැකිය.

1.ඉල්ලුම් ලේඛනය

2.ඉල්ලුම් වක්‍රය

3.ඉල්ලුම් සමීකරණය

- නිශ්චිත අවස්ථාවක ඉල්ලුමට බලපාන අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී සලකා බලන භාණ්ඩයට පැවතිය හැකි විකල්ප මිල ගණන් යටතේ ගැනුම්කරුවන් මිලදී ගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණයන් දක්වන ලේඛනය **"ඉල්ලුම් ලේඛනය"** ලෙස හඳුන්වයි.
- නිශ්චිත අවස්ථාවක,ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩයේ විකල්ප මිල ගණන් යටතේ ඉල්ලුම ප්‍රමාණයන් දක්වන ලක්ෂ්‍යයන් සම්බන්ධ කොට අඳිනු ලබන රේඛාව **"ඉල්ලුම් වක්‍රය"** ලෙස හඳුන්වයි.
- නිශ්චිත අවස්ථාවක ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල ගණන් හා ඉල්ලුම් ප්‍රමාණ අතර ප්‍රතිලෝම සම්බන්ධතාව සමීකරණයක් මගින් සාරාංශ කොට දැක්වීම **"ඉල්ලුම් සමීකරණය"** ලෙස සලකයි.

<u>අභ්‍යාස</u>

1.මිල ප්‍රතිවිපාකය සමන්විත වන උප ප්‍රතිවිපාක දෙක නම් කර පැහැදිලි කරන්න.
2.සාමාන්‍ය භාණ්ඩයක මිල පහළ යාමකදී සහ මිල ඉහළ යාමකදී මිල ප්‍රතිවිපාකය ක්‍රියාත්මක වීම පිළිබඳ පහත වගුව සම්පූර්ණ කරන්න.

මිල වෙනස් වීම	ආදේශන ප්‍රතිවිපාකය	ආදායම් ප්‍රතිවිපාකය	මිල ප්‍රතිවිපාකය
මිල පහළ යාම			
මිල ඉහළ යාම			

3.ඉල්ලුම් නීතියට පටහැනි අවස්ථා මොනවාද?පැහැදිලි කරන්න.